# කාර්ය පත්‍රිකාව

1 පන්තිය- 6 ශ්‍රේණිය    විෂය - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය    අදාළ සතිය - 1

2 පාඩම හෝ ඒකකය - තොරතුරු රැස් කිරීම හා සන්නිවේදනය සඳහා අන්තර්ජාලය භාවිතය

3 මෙම සතිය තුල නියමිත පාඩම් වලින් ලබා ගත යුතු ඉගෙනුම් ඵල

- අන්තර්ජාලය අර්ථ දක්වයි.
- අන්තර්ජාලයට ප්‍රවේශ වීම සඳහා භාවිතා කරන සංරචක හා මෘදුකාංග (වෙබ් අතරික්සු) හඳුනා ගනියි.
- අන්තර්ජාලයට තනිවම පිවිසෙයි.
- අන්තර්ජාලයේ භාවිතය පිළිබඳ හඳුනා ගනියි.

4 ශිෂ්‍යයා කළ යුතු කාර්යයන් කෙටියෙන්

- 6 වන පාඩමේ 6.1 හා 6.2 කොටස් කියවා අවබෝධ කර ගන්න.
- වැඩිහිටියෙකු හෝ ගුරුවරයෙකුගේ උදව් අතැතිව අන්තර්ජාලයට පිවිසෙන්න.
- අන්තර්ජාලයට පිවිසීමට ඔබ භාවිතා කළ මෘදුකාංගය හැර යොදා ගත හැකි වෙනස් මෘදුකාංග පිළිබඳව සොයා බලන්න.
- එම මෘදුකාංග භාවිතයෙන් එක් එක් වෙබ් අඩවිවලට පිවිසෙන අයුරු හඳුනා ගන්න.
- ඊ තක්සලාව ඉ-නැණ පියස පාසල් වෙබ් අඩවි භාවිතා කර පාඩමට අදාල ඉගෙනුම් ආධාරක මගින් වැඩිදුර තොරතුරු අධ්‍යයනය කරන්න.

5 ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කරගත හැකි පොත්පත්, web side, LMS පාඩම්, වෙනත් ආධාරක

- ඊ තක්සලාව- https://www.e-thaksalawa.moe.gov.lk/moodle/course/view.php?id=1323#section-6
- ඉ-නැණ පියස- https://www.enenapiyasa.lk/lms/course/view.php?id=42#section-6
- You Tube- https://youtu.be/IbIMUSPTSgc

**<u>ඇගයීම</u>**

01. අන්තර්ජාලය යනු කුමක්ද?

02. ඔබට අන්තර්ජාලයේ භාවිතයෙන් ලබාගත හැකි සේවාවන් 5ක් ලියා දක්වන්න.

03. අන්තර්ජාලයට පිවිසීමට යොදාගත හැකි වෙබ් අතරික්සු පහක් නම් කරන්න.

04. ඔබ අන්තර්ජාලයට පිවිසෙන ආකාරය පියවර වශයෙන් ලියා දක්වන්න.

05. ඔබට අන්තර්ජාල පහසුකම ලබාගත හැකි අන්තර්ජාල සේවා සැපයුම් කරුවන් ලියා දක්වන්න.